# ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභාව

# රත්නපුර දිස්ත්‍රික්කය

----------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 27 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හිඟ උසාවි දඩ මුදල් ශේෂය රු. 5,143,313 ක් වූ අතර, ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ මුදල් ලැබීම් රු. 6,191,111 කි. ඒ අනුව ණයගැති ශේෂයට වඩා ලැබීම් රු. 1,047,798 ක් සමුච්චිත අරමුදලට බැර කල යුතු වුවත් එසේ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ උසාවි දඩ මුදල් ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විවිධ සේවා සමූපකාර සමිතිය විසින් ප්‍රාදේශීය සභාවට සැපයූ ඉන්ධන වෙනුවෙන් ගෙවිය යුතු මුදල් සඳහා, 2012 ජනවාරි සිට මැයි දක්වා කාලයට අදාල පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාවට ප්‍රේෂණය කල යුතු මුද්දර ගාස්තු මුදලින් රු. 628,558 ක මුදලක් 2013 අප්‍රේල් 09 දින සමිතියට ගෙවා තිබූ අතර, එකී මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමට ගෙන නොතිබූ බැවින් එකී මුදලින් සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 273,956 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,267,712 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,572,111 ක් විය.

2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 27 කට අදාල රු. 555,400 ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබූ අතර, වැය විෂයයන් හතකට අදාල රු. 1,620,000 ක ප්‍රතිපාදන වලින් වෙනත් වැය විෂයයන්ට රු. 411,000 ක මුදලක් මාරු කර තවදුරටත් කිසිඳු වියදමක් නොදරා රු. 1,209,000 ක ප්‍රතිපාදන ඉතිරි වී පැවතුනි.

(ආ) 2010 වර්ෂයේ සිට පැවතඑන රු. 3,116,279 ක් වටිනා ණයහිමි ශේෂ 20 ක් කපා හැරීමට හෝ ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) 1988 වර්ෂයේ සිට 2012 වර්ෂය අවසානය දක්වා එකතුව රු. 1,958,488 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 ' | රු. 000 ' | රු. 000 ' |
| (i) | වරිපනම් හා බදු | 2,613 | 2,562 | 4,354 |
| (ii) | බදු කුලි | 6,155 | 5,454 | 368 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 996 | 434 | - |
| (iv) | වෙනත් ආදායම් | 33,749 | 39,468 | 5,900 |

2.3.2. සතිපොල බදු

පනාමුර සතිපොල 2012 වර්ෂයට බදු දීම සඳහා සීමිත ටෙන්ඩර් මඟින් තෝරාගත් ටෙන්ඩර්කරු සමඟ රු. 1,442,800 ක මුදලකට 2011 දෙසැම්බර් 23 දින ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව 2012 ජනවාරි, පෙබරවාරි මාස 02 ක කාලයක් පමණක් පොල පවත්වා තිබූ අතර, එකී කාලය සඳහා පොල බදු වශයෙන් රු. 150,233 ක් අයකරගෙන තිබුණි. ටෙන්ඩර්කරුට පොල පවත්වා ගෙනයෑමට නොහැකි වීම නිසා ගිවිසුම අවලංගු කර සභාව විසින් මාර්තු සිට දෙසැම්බර් දක්වා රු. 451,700 ක මුදලක් රැස්කර තිබූ අතර, සභාවට ලබාගත හැකිව තිබූ පොල බදු ආදායම රු. 840,867 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.
ටෙන්ඩර්කරු ගිවිසුම කඩකර ඇති නමුත් සභාව විසින් ගිවිසුම කඩකල ටෙන්ඩර්කරුට එරෙහිව ඊළඟ නීතිමය කාර්යය ක්‍රියාවට නංවා නොතිබූ අතර, විගණන දිනය වූ 2013 අගෝස්තු 26 දින වන විටත් ගිවිසුම් ඇප මුදල වූ රු. 304,132 ක මුදල මඟින් ගිවිසුම් කඩකිරීම මත සභාවට සිදුවූ පාඩුව ආවරණය කර ගැනීම සඳහා සහා අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,277,956 |
| (ii) | මුද්දර ගාස්තු | 3,781,540 |

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රු. 306,538 ක වියදමක් දරා 2009 සැප්තැම්බර් 29 දින අළුත්වැඩියා නිම කරන ලද වෙබ්‍රේටින් රෝල අළුත්වැඩියාව නිම කර වසර 04 ක් ගතවී ඇතත් විගණිත දිනය වූ 2013 සැප්තැම්බර් 03 දින වන විටත් සභාව වෙත ගෙන්වා ගෙන ප්‍රයෝජනවත් කටයුත්තකට යොමු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉහත වත්කම අළුත්වැඩියා ගාස්තු ගෙවීම ප්‍රමාද කිරීම මත සභාවට එරෙහිව අළුත්වැඩියා කල ආයතනය විසින් පවරන ලද නඩුවකට නෛතික ගාස්තු ලෙස 2012 දෙසැම්බර් රු. 21,500 ක මුදලක් සභාවට දැරීමට සිදු වී තිබුණි.

2.5 අවිධිමත් ගනුදෙනු

2012 මාර්තු 26 දින සභාවට ලබාගත් තිරරෙදි වෙනුවෙන් රු. 90,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. මිලදී ගැනීම් ක්‍රියාවලියේ අවිධිමත්භාවය පිළිබඳ පළාත් පාලන කොමසාරිස්වරයාගේ අංක සී.එල්.ජී/0107 හා 2011 ඔක්තෝබර් 27 දිනැති ලිපියේ උපදෙස් පරිදි විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය